# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1891/11 - 2014 දෙසැම්බර් මස 02 වැනි අඟහරුවාදා - 2014.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### මුදල් නීති පනත

(422 වැනි අධිකාරය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන ලද රෙගුලාසි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
සභාපති
මුදල් මණ්ඩලය

2014 නොවැම්බර් මස 28 වැනි දින
කොළඹ දීය.

### ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි
### 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සංශෝධනය

1. හැඳින්වීම

1.1 මෙම රෙගුලාසි, 2014 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි යනුවෙන් හැඳින්විය යුතුය.

2. මූලික රෙගුලාසි සංශෝධනය

2.1 2010 සැප්තැම්බර් මස 28 දිනැති අංක 1673/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි පහත පරිදි සංශෝධනය වේ:–

2.2 9 වැනි රෙගුලාසිය, එහි 9.6 ඡේදය ඉවත් කිරීමෙන් පසු සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ:

"9.6 ඉහත දක්වන ලද ආකාරයන් අනුව ගණනය කරන ලද මුළු රක්ෂිත තැන්පතු ප්‍රමාණය මත එක් තැන්පතුකරුවෙකුට ගෙවිය යුතු හානිපූර්ණ මුදල් ප්‍රමාණය රුපියල් 300,000ක් වූ හෝ සුදුසුකම් සහිත විදේශ විනිමය තැන්පතු සම්බන්ධයෙන් වන විට රුපියල් 300,000 කට සමාන ප්‍රමාණයක් වූ උපරිමයකට යටත් වේ."

3. බලාත්මක වන දිනය

3.1 මෙම සංශෝධනය 2015 ජනවාරි මස 01 වැනි දින සිට බලාත්මක විය යුතුය.

12 - 567